# කවි කොළය



## ඔසාමා, ඔබාමා සහ ප්‍රභා !

දස වසරක්ම බින් ලාඩන් ඇනපු ටොකු
කාගෙන - යොදා සී අයි ඒ යකඩ කොකු
ඔහුගේ බලය බිඳ වීරත්වයද මැකු
බැබලෙයි ඔබාමා ලෙස වීරයෙකු ලොකු

අඩි විසිපහක් උස බලකොටුවෙන් වටය
බාබ්ඩ් වයර් ඇද යදමින් බැඳි වැටය
තෙමහල් නිවස තුළ ලාඩා සැප පිටය
ලොව බයවුණේ මේ වගෙ ගොන් පොර කටය

නොතිබිණි තුවක්කුව එල්ලුණු බඳ පටියේ
එක සෙබළෙකුදු නැත අවිගත් රණ පිටියේ
මහ කොටියාට මෙන් ලාඩන් සිටි කුටියේ
නැත බොඩිගාඩ්ලා තුන්සියක් හිටියේ

නොතිබුණු ජොනී බට්ටන් එන මග අටවා
නැත මෝටාර් අට්ටාලය මත සිටවා
යුද අවි නොමැත ගෙන්වූ නැව්වල පටවා
සිටියේ බිරිඳ පමණකි රැකගෙන පැටවා

මහ ගස් වැවුණු කැලයක් නොතිබිණි වත්තේ
හමුදා බැරැක්කය ඒ ළඟමය ඇත්තේ
ඇත මහපාර බස් යන ගෙන් පිට පැත්තේ
රට ඉඳි ගසක් වත් හැංගෙන්නට නැත්තේ

නොතිබිණි සයනයිඩ් කරලක් බැඳ බෙල්ලේ
ඔහු සැඟවුණේ නැත දුවගොස් ගෙයි මුල්ලේ
ගෙන ගඩුගුඩුවක් තාලෙට නව රැල්ලේ
එය උර උරා ඉන්නට ඇත සැන සිල්ලේ

හෙලිකොප්ටරය නිහඬව වහළට බස්සා
යූ එස් ආමි එක දොර බිඳගෙන පස්සා
ගිනි අවි වනන අතරෙහි මුහුණට ගස්සා
ඔහු ආවේද නොදනිමි සුදු කොඩි උස්සා

ජීවිත දහස් ගණනක් පුද කරනු ලබා
ලොව අති දරුණු කොටියා පසුපසම හඹා
කළ දඩයමට මේ සිද්ධිය අලගු තබා
දැක්විය හැකිද? නොහැකිය ඒ කියමි නොබා

වගුරා රුහිරු ගංගා
හෙළ දෙරණ පිට
අපගේ වීර සෙබළුන්
තිස් වසක සිට
කළ මහ සටන ගැන
මොහොතක් සිතන විට
නොපෙනෙයි ඔබාමා
මට වීරයෙකු කොට



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**

**ඒ**ක්සත් රාජධානියේ සරේ ප්‍රාන්තයේ ක්‍රොයිඩන්හි සුප්‍රකට ක්‍රිස්ටල් පැලස් පාපන්දු ඇකඩමිය පැවැත්වූ, වසරේ විශිෂ්ඨ ක්‍රීඩකයා තේරීමේදී මේ නොබෝ දා එම අනගි සම්මානය හිමි වුණේ ශ්‍රීලාංකික දරුවෙකු වන නව හැවිරිදි නයන දිසානායකටය. ඔහු එම ප්‍රාන්තයේම තෝර්න්ටන් හි ගොන්විල් පාඨශාලා වේ 5 වසරේ ඉගෙනුම ලබයි.

වසරක් පාසා ඉහතකී පාපන්දු ඇකඩමිය සරේ ප්‍රාන්තයේ සියළුම පාසැල් වලින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දහය බැගින් තෝරා ඔවුන්ට පාපන්දු ක්‍රීඩාවේ මනා ක්‍රම සහ විධි පිළිබඳව සති 8 ක පුහුණුවක් හා පාඨමාලාවක් පවත්වයි. එය අවසානයේ ඒ සිසුන් අතුරින් ඒ වසරේ විශිෂ්ඨ ක්‍රීඩකයා හා ක්‍රීඩිකාව තෝරයි. මෙවර හොඳම ක්‍රීඩකයා සම්මානය ලැබුණේ හිමිවුණේ කුඩා නයන දිසානායකටය.

නයන තම පාසැලේ ජනප්‍රිය ක්‍රිකට් ක්‍රීඩකයෙකුද වෙයි. ක්‍රිකට් තරඟවලදී පාසැල් මිතුරෝ කෑගසන්නේ කමෝන් මල්ලී කමෝන් ශ්‍රීලංකා යනුවෙනි. ඒ පාසැලේම ඉගෙනුම ලබන ඔහුගේ අයියා වන නලීන්, මල්ලී යයි අමතන නිසා පාසැලේ කවුරුත් දැන් නයනට මල්ලී යයි කියති. ඔවුන් සිතන්නේ එයද ඔහුගේ එක් නමක් කියාය.

නයන කරාටේ ද ප්‍රගුණ කරයි. තව නොබෝ කලකින් ඔහු කලු පටි ලාභියෙකු වනු ඇත. ක්‍රොයිඩන්හි තේම්ස් බෞද්ධ විහාරයේ දහම් පන්තිවලද ඉගෙනුම ලබන නයන ශ්‍රීලංකා සංස්කෘතික කටයුතු වලටද උනන්දුවෙන් සහභාගි වෙයි. ඔහුටද, අයියා නලීන්ටද, කුඩා නැගණිය ඉරුෂදීටද හොඳින් සිංහළ බස කතාකරන්නට, කියවන්නට හා ලියන්නට හැකිය. ඒ ඔවුන්ගේ දෙමාපියන්ගේ කැපවීම නිසාය.

නයන සරේ ප්‍රාන්තයේ තෝර්න්ටන්හීත් පෙදෙසේ පදිංචි දේශප්‍රේමී කුමාර සහ හිෂානි දිසානායක යුවලගේ පුත්‍රයාය. තම දරුවන් සිංහළ ආරට එංගලන්තය තුළ ඇතිදැඩි කරන්නට ඔවුන් ගත් වෙහෙස අද මල්පල ගැන්වී ඇත. සැමට සුබ අනාගතයක් !

# එංගලන්තේ අපේ දක්ෂ දරුවෙක්!

## Crystal Palace Football Academy selects Nayana Dissanayaka as The Outstanding Player of the Year

## වසරේ විශිෂ්ඨතම ක්‍රීඩකයා නයන දිසානායක



Young **Nayana Dissanayaka** has been recently selected as **The Outstanding Player of the Year** by the famous **Crystal Palace Football Academy** in Crodon, Surrey, UK. He is 9 years old, and studies in the 5th year class in **Gonville School** in Thornton Heath, Surrey.

Every year the Academy selects 10 students from each Surrey school and offer them special traing and coaching on football skills for 8 weeks. End of the session, the academy selects two best players, one male and a female. In a football star-studded gala night, the academy presents the Best Player of the Year award. This time, the outstanding player of the year award was won by Nayana Dissanayaka.

Nayana is well loved by all his schoolmates and teachers alike and they think he is an asset to the school. The classmates fondly call him **Malli** as his elder brother Nalin who studies in the same school calls him **Malli**. (the Sinhala term for younger brother)

Nayana has also been nominated as the gifted sportsman of the school for 3 consecutive years. He plays cricket and represents his school against local school teams. Every time he plays, his colleagues cheer and shout " **Come on Malli....Come on Sri Lanka...**" knowing he is from Srilankan origin. He is also a member of Hackbridge karate club and 4 belts behind to collect his black belt.

Nayana attends Dhamma School in Thames Buddhist Viharaya and often takes part in Sri Lankan cultural activities. He can speak, read and write good Sinhala taught by his parents. His younger sister is Irushadee.

Nayana's parents - Kumara and Hishani Dissanayaka who have been residing in Croydon for many years are really proud of their children whom they could bring up according to Sinhala traditions. They say it would not be a big deal for any Sinhala family to do so, if they wanted to.

We wish young Nayana Dissanayaka all success in his future ventures ! It is really a joy to know that we have such talented and well-behaved children in our Sri Lankan community in the UK. Jaya Veva! - **Lanka Viththi**



**ඉරිදා - SUN** පහුගිය මාසෙ ඇමරිකාවෙ ක්‍රිස්තියානි ආගමේ ම කොටසක් ලොකු උද්ඝෝෂණයක් ඇමරිකාව පුරාම ගෙනිච්චා, 2011මැයි 21 වෙනිදා ලෝකෙ විනාස වෙනවයි කියලා. ඒ පිරිසෙ නායකයා දිව්රලා කිව්වා ඒක වෙනවමයි කියලා. ඒ දවසෙන් පස්සෙ ලෝකෙ එක් කෙනෙක්වත් ඉතුරුවෙන්නෙ නැතෙයි කිව්වා. ඒ කතාව තදින්ම විස්වාස කරපු පැන්ෂන්ගිය මනුස්සයෙක් එයාගෙ සල්ලි ඩොලර් ලක්ෂයකටකිට්ටු මුදලක් වියදම්කළා ඇමරිකාව දැනුවත් කරන්න. දැන් 21 වෙනිදා පැන්න. කිසිම ආරංචියක් නැහැ ඒ කස්ටිය දැන් මොනවා කරනවද කියලා. මට කණගාටු අර සල්ලි වියදම් කරපු වැඩිහිටි මනුස්සයා ගැන. එයා ඒ මුළු ජීවිතේ පුරාම ඉතුරු කරපු සල්ලි. ඒක මෝඩ වැඩක් කියලා කියන්නත් බැහැ. කාගෙත් යහපත ගැන හිතලා කරපු වැඩක්.

**සඳුදා - MON** ජාඇල අයිරින් අක්කලා දික්ඕවිට ගිය වෙලාවෙ එහේ පල්ලියක උත්සවයකටත් සහභාගි වෙලා. ඒක ඒ පළාතෙ ධීවර ජනතාව එකතුවෙලා සංවිධානය කරපු එකක්. ටික වෙලාවක් යනකොට උත්සවයෙ ප්‍රධාන අමුත්තා වන ධීවර උප ඇමතිවරයා ආවලු. එයාව පිළි අරගෙන තියෙන්නෙ සාමාන්‍යයෙන් කරන විදියට මල් මාලයක් දාලා. හැබැයි වෙනස් විදියෙ මල් මාලයක්. මල් මාලෙකුත් නෙවෙයි බලනකොට. ඒක ඉස්සො මාලයක්. මොකද එහෙම කරන්න හේතුව බැලුවම ආණ්ඩුවෙන් ඒ කලපුවෙ ඉස්සො අල්ලන්න එපා කියලා දාපු තහනම ඒ ධීවර උපඇමතිවරයා ආණ්ඩුවෙ වග කිවයුතු අයට කන් කෙඳිරිගාලා වෙනස් කරලා දීපු නිසා ඒකට ප්‍රශංසා කිරීමක් හැටියටලු. අයිරින් අක්කා කියනවා බැරිවෙලාවත් ඉස්සොත් එක්ක ඒ මාලෙ පණ පිටින් පොකිරිස්සෙක් හිටිය නම් හරි වැඩේ වෙන්නෙ කියලා.

**කුජදා - TUE** ඊයෙ ලන්ඩන් ඊව්නිං ස්ටැන්ඩර්ඩ් පත්තරේ මුල් පිටුවෙ තිබුණු ප්‍රවෘත්තියක් දැකලා මට හරි පුදුම හිතුණා. මහා බ්‍රිතාන්‍යයේ දෙමව්පියන් සංඛ්‍යාව ගත්තම, සෑම පස්දෙනෙකුගෙන් එක්කෙනෙකුට පොතක් පත්තරයක් කියවන්න බැහැ කියලා තිබුණා. යුරෝපයේ අනික් රටවල් ගැන කොහොම වුනත් මේ ෂේක්ස්පියර්ගෙ එංගලන්තෙ අද මෙහෙමය කියලා කවුද හිතන්නෙ? රටක ප්‍රධාන ජනතාව ඒ විදියට අකුරු ශාස්තරේ ඉගෙනගන නැතිවීම ඒ රටට කොච්චර පාඩුවක්ද? ඒ අතින් ලංකාව ගැන අපි සන්තෝෂ වෙන්න ඕන. මුළුමහත් ලංකාවටම අද තමන්ගෙ භාෂාව හොඳට කියන්න ලියන්න පුළුවන්.

**බුදදා - WED** රන්ජනී මගේ පරණ යාළුවෙක්. විභාගෙකට එයා මාසෙකට ලන්ඩන් ඇවිත්. ඊයෙ රෑ අපේ ගෙදර කෑමට ආවා. ඊයෙ උදේ රන්ජනී ලංකාවට ගෙදරට කෝල් එකක් දීලා තියනවා හස්බන්ඩ්ට කතාකරන්න. කවුද තරුණ ගෑණු කටහඬක් හලෝ කිව්වලු. රන්ජනී ඇහුවලු ඔය කවුද කියලා. එතකොට ඒ ගෑණු කටහඬ කිව්වලු මම නංගි කෙනෙක් කියලා. රන්ජනී ඒ පාර කෑගහලා තියනවා කවුද යකෝ මං නොදන්න නංගි කෙනෙක් අපේ ගෙදර ඉන්නෙ කියලා. ඒපැත්තෙන් ටක් ගාලා පෝන් එක තිබ්බලු. රන්ජනීට හරි අප්සට්. විභාගෙත් දමලා ගහලා ආපහු යන්න හදනවා. මං කිව්වා කලබල වෙන්න එපා, ටිකක් ඉවසන්න කියලා. අනේ ගෑණු අපි කොච්චර අසරණද?

**ගුරුදා - THU** අද කොට්ටාවට කතාකළා කාන්ති නංගිට බබා හම්බවුණාද බලන්න. දුවෙක් හම්බ වුනයි කියලා එමලින් නැන්දා කිව්වා. මං ඇහුවා කවුරු වගේ ද කියලා. ලක්ෂමන් වගේ කට්ට කළුපාටෙයි කියලා නැන්දා කිව්වෙ හිතේ අමාරුවෙන්. මෙන්න හරි වැඩක්! අම්මයි තාත්තයි දෙන්න කළු නම් හම්බවෙන දරුවා කොහොමත් කළුවෙන්න එපැයි. වෙන පාටක් වුනා නම් ඉතින් අහලපහල මිනිස්සුන්ට ලොකු ප්‍රශ්නයක් වෙනවා.

**කිවිදා - FRI** අපිට ලෙඩ දාන එක්සත් ජාතීන්ගේ ලේකම් බැංකි මූන් ආයිත් සැරයක් ලේකම් කමට ඉල්ලන්න යනවා. අවශ්‍ය ඡන්ද ප්‍රමාණෙ ලැබුණොත් මැන් ඒවි. නැත්නම් ඉතින් ගෙදර. බැංකි බලාපොරොත්තු වෙනවා වැඩි දෙනෙක් මිනිහට ඡන්දෙ දෙයි කියලා. රුසියාව, චීනය, ලතින් ඇමරිකාව වගේ රටවල් කීයටවත් බැන්කියට ඡන්දෙ දෙන්නෙ නැහැ. ලංකාව දෙන එහෙකුත් නැහැ. හැබැයි ඊළඟ ප්‍රශ්නෙ තියෙන්නෙ, ඊළඟට එන ලේකම් බැන්කියට වැඩිය නරක එකෙක් වුනොත් ආයිත් අපිට ලෙඩේ. ඒක හන්ද බැන්කියටම අපිත් ඡන්දෙ දෙමු ද?

**ශනිදා - SAT** දැන් ලංකාවෙ අළුත්ම පිස්සුව තමයි දුටුගැමුණු රජ්ජුරුවන්ට නෑකම් කියන එක. සමහරු ජනාධිපතිතුමා නග්ගලා තියන්න ඕන වුනාම මූණටම කියනවා මේ දුටු ගැමුණු පරම්පරාවෙන් එන අපේ ජනාධිපතිතුමා කියලා. මර්වින් සිල්වා කියන්නෙ එයා කෙළින්ම දුටුගැමුණු රජ්ජුරුවන්ගෙ බෑණය කියලා. මර්වින් දුටුගැමුණු විදියට චිත්‍රපටියකත් රඟපානවා හැබැයි ඒ මූණ දැක්කම ලංකාවෙ මිනිස්සුන්ට දුටුගැමුණු රජ්ජුරුවොත් එපා වෙනවා. මේ විකාර විහිළු වැඩ නවත්තන්න ඕන. ඇයි අපේ රටේ මිනිස්සු මේව තේරෙන්නෙ නැත්තෙ ?